# ම□ සෙනෙහස



සනුලි දිනොද්‍යා සේනාරත්න

# මව් සෙනෙහස

සනුලි දිනොද්‍යා සේනාරත්න

පළමු දිගහැරීම

මහ/මහමායා බාලිකා විදුහල
2 ශ්‍රේණිය E

2026/06/10

ISBN : 978-624-211-424-8

# පිදුම



මහමෙරක් තරමට බර
ඔය හිතින් දරාගෙන...
කඳුළැලි සයුර සැඟවුනා
නෙතින් ඔබ...
අත්වාරුව අහිමි වුවත්
පාලමෙන් අප...
එතෙර කර දරු දුක
උහුලා තනිව ඔබ...
සත් ගව්වක් උරමත තියා
නොගියාට...
පතන්නම් 'අම්මේ' ඔබට
ලොව්තුරා මගේ එතෙරට වඩින්නට...

සනුලි දිනෝද්‍යා සේනාරත්න



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

# මව් සෙනෙහස

එකෝමත් එක ගමක හිටියා ලස්සන ගැහැණු ළමයෙක්. ඇයගේ නම තාරුකා. මේ ගැහැණු ළමයා හරිම දක්ෂ ළමයෙක් හැම දෙකටම.



දවසක් උදේම නැගිටලා මුහුණ පිරිසිදු කරගෙන පාසල් යන්න ලෑස්ති වුණා.

බුදුන් වැඳලා, අම්මාටත් වැඳලා පාසල් ගියා.

පාසල් ඇරී ගෙදර එනවිට

වේගයෙන් වෑන් එකේ ආවා.

ඒ ආපු වෑන් එකට මේ පුංචි

තාරුකා යට වුණා.

ඒක දැකපු ගමේ මිනිස්සු

වේගයෙන් තාරුකා ළඟට

දුවගෙන ආවා.



පස්සේ තාරුකා රෝහලට අරන් ගියා. ඒ අරන් යනකොටත් තාරුකාගේ එක අැහැක් හොඳටම තුවාලවෙලයි තිබුණේ.

තාරුකාව දැකපු අම්මාට ගොඩක් දුක හිතුනා.

තාරුකායි, අම්මායි

දෙන්නම ඇඬුවා.

තාරුකාට ආයෙත් ඇසේ

පෙනුම ගන්න නම්

ඇහැක් බද්ධ කරන්න

වුණා.

පස්සේ තාරුකාගේ අම්මාට ඕනේ වුනේ තාරකාගේ ඇස් දෙකම තිබුණු විදියටම දකින්න.

අම්මා හැමෝගෙන්ම උදව් ඉල්ලුවා.

කාටවත් තාරුකාට උදව් කරන්න බැරි වුණා.

පස්සේ තාරුකාගේ අම්මාට හිතුනා මගේ ඇස් දෙකෙන් එක ඇහැක් මගේ පුංචි කෙල්ලට බද්ධ කරනවා කියලා.

ඔපරේෂන් එක සාර්ථකයි. තාරුකාට දැන් ඇස් දෙකම පේනවා.

ඒත් අම්මාගේ එක ඇහැක් නෑ කියලා දැනගත්තට පස්සේ තාරුකාට ගොඩාක් දුක හිතුනා.

අම්මාට ගොඩාක් සතුටුයි.



මව් සෙනෙහස කියන්නේ ගොඩාක් උත්තරීතර දෙයක්. ඒකට ඔය කොයිදේත් යටයි. තමන්ගේ දරුවන් වෙනුවෙන් දෙමාපියන්ට ඇස් විතරක් නෙවෙයි මුළු ශරීරයම උනත් දන් දෙන්න පුළුවන්.

මම මගේ අම්මාට ගොඩාක්

ආදරෙයි.



මේ පොත සාදා ගැනීමට

මට උදව් කරපු

මගේ රත්තරන් අම්මාට

මම ගොඩාක් ආදරෙයි.

මගේ මුල්ම කෘතිය මගේ අම්මාට

උපහාරයක්ම වේවා !

මතු උපදින හැම භවයකම

මගෙත්, මගේ අයියාගෙත්

අපි දෙන්නටම අම්මාවෙලා උපදීවා !



සනුලි දිනෝදයා සේනාරත්න